# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2023

9 ශ්‍රේණිය

**කතෝලික ධර්මය** **කාලය :පැය 2 යි**

## 1 කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින්ඉරක් අඳින්න.**

(1) පුරාණ ගිවිසුමේ පළමු පොත් පහ හඳුන්වන්නේ
1/ දිවැසිවර ග්‍රන්ථ නමිනි 2/ ශුභාරංචි නමිනි
3/ පංච පුස්තකය නමිනි 4/ මහෝපදේශය නමිනි

(2) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ විශේෂයෙන් සඳහන් වන්නේ
1/ ජේසුස් වහන්සේගේ දූත කාර්යය පිළිබඳවයි
2/ පේදුරු තුමාගේ ප්‍රථම දේශනය පිළිබඳවයි
3/ ස්නාවක ජුවාම් තුමාගේ ඉගැන්වීම් පිළිබඳවයි
4/ පේදුරු හා පාවුලු අපෝස්තුලුවරුන්ගේක්‍රියා පිළිබඳවයි

(3) " ගීතාවලිය " පොත හඳුන්වන වෙනත් නමක් නොවන්නේ
1/ කිතුනු ගී පොත 2/ ගී කළඹ
3/ ඊශ්‍රායෙල් ජනතාවගේ යැදුම් පොත 4/ ශු. බයිබලයේ යාච්ඤා පොත

(4) ශුද්ධ වූ මාක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නමක් වන්නේ
1/ දේව රාජ්‍යයේ ශුභාරංචිය 2/ ශුද්ධ වූ සභාවේ ශුභාරංචිය
3/ දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය 4/ යාච්ඤාවේ ශුභාරංචිය

(5) "මම වෙමි " ප්‍රකාශන හතක් ඇතුළත් ශුභාරංචිය වන්නේ,
1/ ශු. මතෙව් ශුභාරංචිය 2/ ශු. ජොහන් ශුභාරංචිය
3/ ශු. මාක් ශුභාරංචියයි 4/ ශු. ලූක් ශුභාරංචියයි

(6) නුඹ යම් දවසක ඒ ගසින් කන්නෙහි ද , ඒ දවසෙහි මරණය නුඹට ඒකාන්තය" දෙවියන් වහන්සේ මෙලෙස අවවාද කරනු ලැබුවේ,
1/ ආදම් හා ඒවට ය 2/ නෝවාට ය
3/ කායින් හා ආබෙල්යට ය 4/ ආබ්‍රහම් ට ය

(7) කායින් විසින් ආබෙල්ව මරා දැමීමට මුල් වූ මුල් අගුණ පාපය වන්නේ
1/ රාගය 2/ කැදරය 3/ අලසකම 4/ඊර්ෂ්‍යාව

(8) නව මැවිල්ලක ආරම්භකයා ලෙස දෙවියන් වහන්සේ තෝරා ගත් තැනැත්තා වනුයේ
1/ නෝවා 2/ ආබ්‍රහම් 3/ මෝසෙස් 4/ ජාකොබ්

(9) වීර නායකයින් පිළිබඳ වැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න
1/ වීර නායකයින් සිටි කාලය ක්‍රි.පූ. 1200 – 1050 දක්වා විය
2/ වීර නායකයින්ගේ නායකත්වය මුළු ඊශ්‍රායෙල් ජාතිය කෙරෙහි ම විය
3/ වීර නායකයින් බාහිර ආක්‍රමණ හා බලපෑම් වලින් ඊශ්‍රායෙල් ජනයාව මුදා ගත්හ
4/ වීර නායකයින් පත් කිරීම පිළිබඳව වීරාවලියේ සඳහන් වේ

(10) දෙවියන් වහන්සේ ඊශ්‍රායෙලයේ දෙවන රජතුමා ලෙස තෝරා ගනු ලැබුවේ
1/ ජෙස්සේගේ පුතුන් අතරින් කෙනෙකි
2/ කිෂ්ගේ පුතුන් අතරින් කෙනෙකි
3/ පිය පුත් උරුමය අනුවය
4/ සාමුවෙල්ගේ කැමැත්ත අනුවය

(11) "ජන්මයේදී ම ආදි මව්පියන්ගෙන් අප ලබන පාප දෝෂය ජන්ම පාප දෝෂයයි" මෙලෙස සඳහන් වන්නේ,
1/ හිතෝපදේෂයේ ය 2/ මහෝපදේශයේ ය 3/ ගීතාවලියේ ය 4/ ශු. ලූක් ශුභාරංචියේ ය.

(12) ශුද්ධ වූ අගුස්තීනු තුමා ප්‍රසාද ස්නාපනය ලැබුවේ
1/ අවුරුදු 33 දී ය 2/ අවුරුදු 30 දී ය 3/ අවුරුදු 35 දී ය 4/ අවුරුදු 38 දී ය

(13) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය, රෝගීන්ගේ ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය, මාර්ගෝපාකාර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යන දේව ප්‍රසාද නිධාන තුන හඳුන්වන නාමය වන්නේ,
1/ ආරම්භක දේව ප්‍රසාද නිධාන 2/ සමාජීය දේව ප්‍රසාද නිධාන
3/ සුවදානයේ දේව ප්‍රසාද නිධාන 4/ ස්වර්ගීය නිවහනට අපව සූදානම් කරන දේව ප්‍රසාද නිධාන

(14) අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් අනුව රෝගීන් ආලේප කරනු ලබන්නේ,
1/ ප්‍රජා මූලිකයන් විසිනි 2/ පූජාප්‍රසාදීන් වන්සේලා විසිනි
3/ නායක පූජකයන් විසිනි 4/ විනිශ්චයකරුවන් විසිනි

(15) රෝගීන්ගේ ආලේප කිරීමේ පිළිවෙතේ අංගයක් නොවන්නේ,
1/ දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව 2/ ආලේපනය
3/ විශ්වාසකයින්ගේ යාච්ඤා 4/ පශ්චත්තාපික පිළිවෙත

(16) අපගේ ජීවිත ................................ මන්දිර වේ. මෙහි හිස්තැනට අදාළ වචනය වන්නේ,
1/ දෙවියන්වහන්සේගේ 2/ ජේසුස් වහන්සේගේ
3/ ශුද්ධාත්මයාණන් වහන්සේගේ 4/ ශුද්ධවන්තයන්ගේ

(17) " ගබ්සාව ළදරු ඝාතනයකි. අශික්ෂිත අපරාධයකි." මෙලෙස දැක්වෙන්නේ
1/ කතෝලික සභා ධර්මෝපදේශයේය 2/ මහෝපදේශයේය .
3/ ශුද්ධ බයිබලයේ ය 4/ ශුභාරංචි ග්‍රන්ථ වලය.

(18) ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට නම් අප විසින් නොකළ යුතු ක්‍රියාවකි
1/ යාච්ඤා කිරීම 2/ යහපත් ක්‍රියා කිරීම
3/ දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම 4/ අනුන්ගේ වැරදි පමණක් දැකීම

(19) ස්වර්ගයට මොර ගසන පාපයක් වන්නේ
1/ බොරුකීම 2/ සොරකම් කිරීම
3/ දුගීන්ට හිංසා කිරීම 4/ ගස් කැපීම

(20) අප අතින් පාපයක් සිදු වූ විට පළමුවෙන් ම කළ යුතු වන්නේ.
1/ ඒ පිළිබඳ හිතවතෙකුට පැවසීමයි 2/ ඒ පිළිබඳ මනස්ථාපනය වීමයි
3/ පාපයට හේතුව සෙවීමයි 4/ දිව්‍ය සත්ප්‍රසාද ලබා ගැනීමයි

(ලකුණු 2 X20=40)

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2023**

**9 ශ්‍රේණිය**

**කතෝලික ධර්මය**

**2 කොටස**

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න .**

(1) 1/ "මම වෙමි" ප්‍රකාශන 02 ක් ලියන්න
2/ වීර නායකයින් දෙදෙනෙකු නම් කරන්න
3/ සාමුවෙල් විනිශ්චයකාරයා දැරූ තනතුරු 2 ක් ලියන්න
4/ දේව වරප්‍රසාද කොටස් දෙක නම් කරන්න
5/ මුල් අගුණ පව් දෙකක් ලියන්න.
6/ පව්කමාවේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න
7/ ඊශ්‍රායෙලයේ පළමු හා දෙවන රජවරුන්ව නම් කරන්න
8/ ආරම්භක දේව ප්‍රසාද නිධාන 2 ක් නම් කරන්න
9/ මරණීය පාපයෙන් ලැබෙන විපාක 2 ක් ලියන්න
10/ රෝගීන් වෙනුවෙන් ඔබට ඉටු කළ හැකි යුතුකම් දෙකක් ලියන්න.

(ලකුණු 2X10=20)

(2) 1/ පංච පුස්තකයට අයත් පොත් 2 ක් නම් කරන්න (ලකුණු 2)
2/ නව ගිවිසුමේ පොත් බෙදෙන කොටස් තුන නම් කරන්න (ලකුණු 3)
3/ ශුද්ධ බයිබලය තුළින් ඔබගේ ජීවිතය හරිමග ගෙන යාමට ගත හැකි ආදර්ශ 5ක් ලියන්න (ලකුණු 5)

(3) 1/ ශු. මතෙව් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න (ලකුණු 2)
2/ සමදර්ශක ශුභාරංචි 03 ලියන්න (ලකුණු 3)
3/ ශුභාරංචිය පතල කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 5 ක් ලියන්න (ලකුණු 5)

(4) 1/ ඒදන් උයනේ පදිංචි කළ ආදම් හා ඒව්ට දෙවියන් වහන්සේ දුන් අවවාදය ලියන්න (ලකුණු 2)
2/ පාපය වැළඳ ගත් ඒව්ට ලැබුණු දඬුවම් 3 ක් ලියන්න (ලකුණු 3)
3/ ඔබව පාපයට අසුවිය හැකි අවස්ථා 2 ක් දක්වා ඉන් වැළකීමට කළ හැකි දේවල් 3 ක් ලියන්න(ලකුණු5)

(5) 1/ දෙවියන් වහන්සේ ජලගැල්මක් ලෝකයට එවීමට හේතුව කුමක්ද? (ලකුණු 2)
2/ නෝවාගේ පුතුන් තිදෙනාගේ නම් ලියන්න (ලකුණු 3)
3/ පාපී ක්‍රියා වලට යොමුවූ අයෙකුව ඉන් මුදවා ගැනීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න (ලකුණු 5)

(6) 1/ පාපයට ලැබෙන දඬුවම් දෙවර්ගය ලියන්න (ලකුණු 2)
2/ පාපොච්චාරණ පිළිවෙතේ අංග තුනක් ලියන්න (ලකුණු 3)
3/ වඩාත් සාර්ථක ලෙස පව් සමාව ලබා ගැනීමට අප සූදානම් විය යුතු ආකාරය ලියා දක්වන්න (ලකුණු 5)

(7) 1/ පස්වන දේව පනත ලියන්න (ලකුණු 2)
2/ තම ජීවිතයට ආදරය කිරීම සඳහා කළ හැකි දේවල් 3 ක් ලියන්න (ලකුණු 3)
3/ ජීවිතයේ වටිනාකම අවබෝධ කර ගැනීමට මිනිස් අපට හැකියාව ලබා දෙන ලෙස දෙවි පියාගෙන් ඉල්ලමින් යාච්ඤාවක් නිර්මාණය කරන්න (ලකුණු 5)